කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2015

2020 පෙබරවාරි - සැප්තැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

නාට්‍ය හා රංග කලාව

රංග කලාවේ මූලිකාංග DMAT E - 1015

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. නාට්‍ය කලාව හා රංග කලාව යන පාරිභාෂික වචන හා බැඳි අර්ථ පිළිබඳ ව පෙරදිග හා අපරදිග පඬිවරුන් විසින් ඉදිරිපත්කර ඇති නිර්වචන ඇසුරින් "නාට්‍ය" යනු කෙබඳු කලාවක් දැයි විග්‍රහ කරන්න.

02. නාට්‍ය කලාවේ ප්‍රභවය පෙරදිග හා අපරදිග රංග කලා ඉතිහාසය ඇසුරින් විස්තර කරන්න.

03. කතන්දරය ( story ) හා කතා වස්තුව ( plot ) අතර ඇති සමාන අසමාන ලක්ෂණ නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

04. "ගැටුමක් නැති තැන නාට්‍යයක් නැත." නිදසුන් සහිතව විග්‍රහ කරන්න.

05. "නාට්‍ය වූ කලී සාමූහික කලා නිමැවුමකි." නිදසුන් සහිතව පහදන්න.

06. රංග ශෛලිය හා නාට්‍ය ප්‍රභේද යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? නිදර්ශනාත්මක ව පහදන්න.

07. රචනය, රඟපෑම, නිෂ්පාදනය යන අවස්ථාවන්හි නාට්‍ය නිර්මාණයක සිදුවන කාර්යභාරය කුමක් දැයි විමසා බලන්න.

08. මෑතක දී ඔබ නැරඹූ හොඳ නාට්‍යයක් තෝරාගෙන එහි රූපණය, සන්දර්භය, හා ශෛලිය පිළිබඳව විචාරයක් කරන්න.

09. සාර්ථක නාට්‍ය රචනාවක තිබිය යුතු ලක්ෂණ හා ගුණාංග තෝරාගත් නාට්‍ය රචනා තුනක් ඇසුරින් පහදන්න.

10. මාතෘකා හතරක් (04) පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1. | ට්‍රැජඩි ( Tragedy ) | 4. | අනුකරණය හා සමාරෝපය |
| 2. | සතර අභිනය | 5. | නෘත්ත, නෘත්‍ය, නාට්‍ය |
| 3. | අසම්මත නාට්‍ය | 6. | කොමඩි ( comedy ) |

*************************